66

මගේ අංකය / My No. } 4/10/චක්‍රලේඛ
ඔබේ අංකය / Your No. }
ෆැක්ස් / Fax } 684051

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT
අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7
இல. 7, கிறகறீஸ் வீதி, கொழும்பு 7
No. 7. Gregory's Avenue Colombo 7

19 96.12. 1[illegible]

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.

පළාත් ඉඩම් කොමසාරිස් ... 16-12-1996

**රජයේ ඉඩම් පවරාදීමේදී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ**

ඉහත කරුණට අදාළව සැලකිල්ල, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ... එවන ලද ජනාධිපති ලේකම්ගේ අංක. පීඑස්/සී/4/34 හා 1995.07.12 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. ඉහත චක්‍රලේඛයේ 8(අ) ඡේදයේ සඳහන් දීර්ඝකාලීන බදුකරයක ප්‍රාරම්භක බදු මුදල අවුරුදු පහකට වරක් පුනරීක්ෂණය කිරීම සම්බන්ධව අර්ථ නිරූපණයන් රැසක් ගැටළු මතුවී තිබෙන බව පෙනී යන බැවිනි. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගන්නා ලද අතර, ඒ අනුව වසර පහකට පසු බදු කුලිය කලින් පවතින බදු ප්‍රමාණයෙන් එකහමාරකට නොඅඩු විය යුතු බවට වැඩිවිය යුතු බව ජනාධිපති ලේකම්ගේ අංක. පීඑස්/සී/4/34 හා 1996.11.18 දිනැති ලිපියෙන් දන්වා ඇත.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිදර්ශනයට ඔබේ අවධානය යොමු කරමි.

" කලින් බදු මුදල - වර්ෂයකට රු. 10,000 ක් නම් වසර පහකට පසුව

සංශෝධිත බදු මුදල - වසරකට රු. 15,000කට නොඅඩු විය යුතුය."

03. බදු සංශෝධනය කිරීමේදී මේ අනුව කටයුතු කළයුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වමි.

එම්.ජේ.කේ. කුමාරසිරි
ඉඩම් කොමසාරිස්.

3239

10


මගේ අංකය
எனது இல.
My No. } 4/10/14290(I).

චක්‍රලේඛ අංක. 96/12.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

ඔබේ අංකය
உமது இல.
Your No. }

ෆැක්ස්
பெக்ஸ்
Fax } 684051

අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7
இல. 7, கிரகரிஸ் மாவத்தை, கொழும்பு 7
No. 7, Gregory's Avenue, Colombo 7


19 96.10.12

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.


ප්‍රාදේශීය ලේකම්
... ලේකම් කාර්යාලය
[illegible]-10-1996
ගාල්ල


**ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී හමුදා සහ පොලිස් සේවයේ ආබාධිත වූ සහ මියගිය නිලධාරීන්ගේ පවුල්වල යැපෙන්නන්ට ද දැනට සේවයේ යෙදී සිටින හමුදා සහ පොලිස් සේවාවන්හි නිලධාරීන්ටද නිවාස සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය**

උතුරු නැගෙනහිර ක්‍රියාන්විත සේවයේ යෙදී සිට ආබාධිත වූ හමුදා සහ පොලිස් නිලධාරීන්ට සහ ක්‍රියාන්විත සේවයේ යෙදී සිට මියගිය හමුදා සහ පොලිස් සාමාජිකයින්ගේ පවුල්වල යැපෙන්නන්ට පදිංචිය සඳහා නිවාස ඉඩම් ලබා දීමට මගේ අංක.4/10/14290(I) සහ 1995.08.06 දින දරණ චක්‍රලේඛයේ උපදෙස් අනුව දැනටමත් සුදුසු ඉඩම් තෝරාගෙන ඇති බව සමහර ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මා වෙත වාර්තා කර ඇත.

02. ක්‍රියාන්විත සේවයේ යෙදී සිට මියගිය සහ ආබාධිත හමුදා සහ පොලිස් නිලධාරීන් සඳහා නිවාස ඉඩම් ලබා දීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයන් අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇති අතර, එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ එවමි.

03. ඉහත වැඩසටහන යටතේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් තෝරා ගනු ලබන පහත සඳහන් කාණ්ඩයන් වලට අයත්වන හමුදා නිලධාරීන්ට ඉඩම් භාර දීමේ කටයුතු කොටස 03 ක් අනුව නිම කළ යුතු බව තීරණය වී ඇත.

(I) ක්‍රියාන්විතයේදී මියගිය හමුදා සාමාජිකයින්ගේ සහ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන්.

(II) ක්‍රියාන්විතයේදී ආබාධිත වූ හමුදා සාමාජිකයන් හා පොලිස් නිලධාරීන්.

(III) දැනට ක්‍රියාන්විතයේ යෙදී සිටින හමුදා සහ පොලිස් නිලධාරීන්.

04. එසේ දැනුම් දීමෙන් පසු ඔබගෙන් අනුමත වී තෝරාගනු ලබන නිවාස ඉඩම්ලාභීන්ට ඉඩම් කොටස් භාරදීම පිණිස පහත සඳහන් මූලික ක්‍රියා මාර්ග ආරම්භ කිරීමට ඔබට උපදෙස් දෙනු ලැබේ. එම නිසා ඔබ කොට්ඨාශයේ ආබාධිත සෙබළුන්ට ලබා දීම සඳහා හඳුනාගෙන ඇති ඉඩම් සම්බන්ධයෙන් නොපමාව පහත සඳහන් ක්‍රියා මාර්ග ගන්න.


/..2



දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 695824, 695833, 695834, 695835, 695837, 695844, 680035

I. දැනටමත් ඔබ කොට්ඨාශයේ තෝරාගෙන ඇති ඉඩම් පරීක්ෂාකර ඒවා නිවාස තැනීම සඳහා යෝග්‍ය ඉඩම් දැයි විමසා බලන්න. භූමියේ ගල් සහිත නොවිය යුතු අතර, ප්‍රවේශ මාර්ග ජල පහසුකම් හා විදුලිය තිබේනම් වඩාත් යෝග්‍ය වේ.

II. රාජ්‍ය අභ්‍යන්තර අමාත්‍යාංශය මඟින් තෝරාගෙන ඔබවෙත එවනු ලබන නාම ලේඛන වල සඳහන් අයට එකාම ඉඩම් භාරදිය හැකි වන පරිදි මෙම ඉඩම් වල කට්ටි කැඩීමේ සැලසුම් සකස් කරවන්න. ඉඩම් ඒකකය පර්.15 සිට 30 අතර විය යුතු අතර, ප්‍රදේශයේ ඉඩම් වලට ඇති ඉල්ලුම හා බෙදා දීමට ඇති ඉඩම්වල ප්‍රමාණය අනුව ඉඩම් ඒකකය තීරණය කරන්න.

එසේ තෝරා ගන්නා ඉඩම්, කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛ අංක 94/8 දරණ එල්/2/5/42 හා 1994.12.06 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි ජනාකීර්ණ නගර සීමා තුළ පර්චස් 10 ක් සහ අනෙකුත් ප්‍රදේශ වල උපරිමය පර්.300 යටත්ව පර්චස් 15 සිට 30 දක්වා ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් කට්ටි සැලසුම් පිළියෙල කිරීමට, ක්‍රියා කරන්න.

III. මහවැලි ඉඩම් හා රජයේ ඉඩම් ලබා ගැනීම සඳහා තෝරාගන්නා පුද්ගලයන්ට ප්‍රධාන තක්සේරුකරුගේ, තක්සේරුව අනුව ඉඩමේ මුළු වටිනාකම ගෙවන ලද්දේ නම්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, ඉඩමේ තක්සේරු වටිනාකම කොටස් වශයෙන් ගෙවීමට බලාපොරොත්තු වන්නේ නම්, දීර්ඝකාලීන බදු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. බදු කාලය තුළදී ඉඩමේ තක්සේරු වටිනාකම බදුකරු විසින් ගෙවන්නේ නම්, එසේ ගෙවීමෙන් පසුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කළ හැකිය.

IV. ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට අයත් ඉඩම් විකිණීමේ පදනම යටතේ කොමසාරිස් [illegible] මඟින් සපයා දෙනු ඇත.

V ඔබ කොට්ඨාශයේ හඳුනාගෙන ඇති ඉඩම් වලින් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට අයත් ඉඩම් හා මහවැලි අධිකාරියට අයත් ඉඩම් ඒ ඒ ආයතන විසින් බෙදා දෙනු ලැබේ. එම නිසා එම ඉඩම් සඳහා ලැබෙන නාම ලේඛන පිළිවෙලින් පළාත් අධ්‍යක්ෂ වරුන් සහ නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත යොමු කළ යුතුය.

03. විශේෂ වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වෙද්දී වියපත් හා ආබාධිත වූ අයට ඉඩම් ලබා දෙන බැවින්, ආබාධිත අයට ඉඩම් ලබාදීම සඳහා ඔබ වෙත දැනටමත් ඉල්ලුම්පත් ලැබී ඇත්නම් ඒවා වෙන වෙනම සලකා බැලීම නොකළ යුතුය. එවැනි ඉල්ලීම් ද මෙම විශේෂ වැඩ සටහනට යොමු කරන්න.

04. හමුදාපතිවරුන් සහ පොලිස්පති විසින් අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇති සීමාවන් අනුව ඉඩම් ලාභීන් තෝරා ගැනීමට නියමිත අතර, එම ලැයිස්තු රාජ්‍ය ආරක්ෂක ලේකම් විසින් ඔබ වෙත එවනු ලැබේ. එසේ එම ලැයිස්තු ලැබීමෙන් පසු එම ඉඩම් ලාභීන්ට ඉඩම් බෙදා දීම හැකි ඉක්මනින් කළයුතුව ඇති හෙයින් ඉහත තුන්වන ඡේදයේ උපදෙස් අනුව නිවාසලාභීන්ට බෙදා දීමට යෝග්‍ය ඉඩම් කට්ටි කැඩීමේ සැලසුම් සකස් කර ගන්නා ලෙස උපදෙස් දෙමි.

05. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් තෝරාගත් නාම ලේඛන ලැබුණු පසු ඔවුන්ට රජයේ ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට මා විසින් කටයුතු කරන අතර, අනෙකුත් ඉඩම් සම්බන්ධයෙන් අදාළ ආයතන මගින් අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරනු ඇත.

ඩබ්.කේ.කේ. කුමාරසිරි,
ඉඩම් කොමසාරිස්.

පිටපත් :-
1. ජනාධිපති ලේකම්.
2. කෘ.ඉ.හා ව.ස./ලේකම්.
3. රාජ්‍ය ආරක්ෂක/ලේකම් - ඔබ විසින් ඉඩම් ලබාදීම සඳහා තෝරාගන්නා අයට ගරු කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යතුමාගේ විධිමත් අනුමැතිය ලබාගැනීම සඳහා නාම ලේඛනයේ පිටපතක් මා වෙත එවන මෙන් ඉල්ලමි.
4. යුද හමුදාපති
5. නාවික හමුදාපති
6. ගුවන් හමුදාපති
7. පොලිස්පති
8. පළාත් ඉඩම් කොමසාරිස් ................
9. සභාපති, ජනවසම
10. සභාපති, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව
11. රාජ්‍ය පරිපාලන හා වැවිලි කර්මාන්ත/ලේකම්, වැවිලි කර්මාන්ත අංශය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ-02.
12. අධ්‍යක්ෂ, (ජනාවාස), (මහවැලි) වාරිමාර්ග විදුලි බල අමාත්‍යාංශය
13. කළමනාකරු-ඉඩම්-මහවැලි ආර්ථික ඒජන්සිය, 500, ටී.බී.ජයා මාවත, කොළඹ-10.
14. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

තත්/23.